00126

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙරපාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩසටහන 2017/2018

අවසාන පරීක්ෂණය

**EPC1332/ESC1132-** පෙරපාසල් අධ්‍යාපන මූලධර්ම

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2019.04.22 වේලාව - පෙ.ව.10.00 - මධ්‍යාහ්න 12.00 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## <u>1 වන කොටස</u>

01. ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය පිළිබඳව මාරියා මොන්ටිසෝරි විසින් ඉදිරිපත් කරන ලද අදහස් පහක් (05) සඳහන් කරන්න.

02. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක ක්‍රියාත්මක වන දෑ පහක් (05) සාකච්ඡා කරන්න.

03. ළමයකුගේ උපරිම යහපත (Best Interests) යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

04. “පෙරපාසල් අධ්‍යාපනය ” යන පදය නිර්වචනය කරන්න.

05. ශ්‍රී ලංකාවේ පෙරපාසල් අධ්‍යාපනය හා සම්බන්ධ ගැටලු පහක් (05) ලැයිස්තුගත කරන්න.

06. “ඉලෙක්ට්‍රොනික් උපාංග (Electronic devices) දරුවන්ගේ ඉගෙනුම් සඳහා උදව් වන බව දෙමාපියන්ගේ විශ්වාසයයි. කෙසේවුවද, ඉලෙක්ට්‍රොනික් උපාංගවලින් තොරව පෙරපාසල් දරුවන්ට හොඳින් ඉගෙනීම කළ හැකිවේ.”

    මෙම වගන්ති පිළිබඳව ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු ඉදිරිපත් කරන්න.

07. ශාරීරික දඬුවම් දීම සම්බන්ධයෙන් දාර්ශනිකයන්ගේ විවිධ අදහස් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ශ්‍රී ලංකාවේ පෙරපාසල් ගුරුවරයකුගේ ප්‍රධාන භූමිකා තුනක් (03) සඳහන් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## දෙවන කොටස

09. (a) ශ්‍රී ලංකාවේ පෙරපාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ වැදගත්කම කුමක් ද? (ලකුණු 08)

(b) ශ්‍රී ලංකාවේ මෙහෙයවන ලද ගුරුපුහුණු වැඩසටහන් දෙකක් **(02)** තෝරාගෙන එම වැඩසටහන් දෙකෙහි ගුණාත්මක භාවය පිළිබඳ ඔබේ අදහස් මොනවාදැයි සඳහන් කරන්න. (ලකුණු 12)

10. (a) එක්සත් රාජධානියේ (UK) පෙරපාසල් අධ්‍යාපනයේ අරමුණු පහක් **(05)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(b) ශ්‍රී ලංකාවේ පෙරපාසල් අධ්‍යාපනයට යෝග්‍ය අරමුණු යෝජනා කරන්න. (ශ්‍රී ලංකාවේ සමාජ, සංස්කෘතික සහ ආර්ථික සාධක කෙරෙහි අවධානය යොමු කරන්න.) (ලකුණු 12)

11. (a) පෙරපාසල් වයසේ සිටින දරුවන් උදෙසා අධ්‍යාපනය ලබාදීමේ දී රූසෝ සහ මොන්ටිසෝරි විසින් ඉදිරිපත් කරන ලද අදහස් දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 04)

(b) ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය සංකල්පයට ඉහත සඳහන් කළ අදහස් කෙබඳු ආකාරයකින් දායකත්වයක් ලබා දුන්නේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(c) පෙරපාසල් අධ්‍යාපනයේ ළමා කේන්ද්‍රීය වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 08)

12 (a) ශ්‍රී ලංකාවේ පෙරපාසල් අධ්‍යාපනයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 08)

(b) ශ්‍රී ලංකාවේ වර්තමාන පෙරපාසල් අධ්‍යාපනයේ සුවිශේෂ ලක්ෂණ පහක් **(05)** අදාළ උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 12)

13. "ශ්‍රී ලංකාවේ පෙරපාසල් අධ්‍යාපනය සඳහා පොදු විෂයමාලාවක් සෑම පෙරපාසලකටම අවශ්‍යය."

(a) මෙම කියමන සමග ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට උදාහරණ දෙන්න. (ලකුණු 10)

(b) පෙරපාසලක ගුරු-දෙමාපිය සම්බන්ධතා පවත්වාගෙන යාමේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.